# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.08.18 පැය 0615 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1606/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**</u>

### 01. මනුෂ්‍ය ඝාතනයක් - දිවුලපිටිය පොලිස් වසම.

2025.08.17 වන දින අළුයම් කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ ඉහල මඩම්පැල්ල ප්‍රදේශයේ අවන්හලකදී පිරිසක් විසින් පුද්ගලයෙකුට අතින් පයින් හා පොලු වලින් පහරදී තියුණු ආයුධයකින් කපා ඝාතනය කර ඇති බවට දිවුලපිටිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ ඉහල මඩම්පැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු අවන්හලට පැමිණ සිටි අවස්ථාවේදී පිරිසක් විසින් පුද්ගලික ආරවුලක් හේතුවෙන් ඇති වූ බහින් බස්වීමක් දුරදිග යාමෙන් මෙම ඝාතනය සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදි අනාවරණය වී ඇත.

මෘත ශරීරය ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අපරාධයට සම්බන්ධ සැකකරුවන් මෙතෙක් අත්අඩංගුවට ගෙන නොමැති අතර සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

### 02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - සෙවනගල පොලිස් වසම

2025.08.17 වන දින සවස් කාලයේ සෙවනගල පොලිස් වසමේ හබුරුගල බෝධිරාජ වැවේ පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට සෙවනගල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්නයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 42 ක් වූ මහගම ජනපදය, සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා තවත් පුද්ගලයෙකු ඉහත කී වැවේ මසුන් අල්ලමින් සිටියදී වළකට වැටී දියේ ගිලී මියගොස් ඇති බව සිදුකල විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සිද්ධිය සම්බන්ධව සෙවනගල පොලිසිය විමශර්න සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - ඕමන්ත පොලිස් වසම.

2025.08.17 වන දින රාත්‍රී කාලයේ ඕමන්ත පොලිස් වසමේ මහනුවර යාපනය ඒ9 මාර්ගයේ ඕමන්ත ප්‍රදේශයේදී වව්නියාව දෙස සිට යාපනය දෙසට ධාවනය වූ කැබ් රථයක් රියදුරුට රථය පාලනය කරගැනීමට නොහැකිව මාර්ගයේ පෙරළී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කැබ් රථයේ රියදුරු ඇතුළු එහි ගමන් කල කාන්තාවන් 10 දෙනෙකු පිරිමි පුද්ගලයින් 07 දෙනෙකු හා ළමුන් 05 දෙනෙකු බරපතල තුවාල ලබා වව්නියාව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු කාන්තාවක් හා පිරිමි පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් හා මරණකාරිය වයස අවුරුදු 29 ක් වූ ධමර්පුරම්, කිළිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර වව්නියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ඕමන්ත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**